වේල්ස් කුමරි විදුහල මොරටුව
Princess of Wales' College - Moratuwa

| 45 | S | I |
|---|---|---|

13 වන ශ්‍රේණිය - පළමුවන වාර ඇගයීම
Grade 13 – 1st Term Test – Nov 2018

බෞද්ධ ශිෂ්ටාචාරය - I
Buddhist Culture - I

කාලය පැය 02 යි
Two Hours

නම :- ........................................................................................ පන්තිය :- ...........................

**උපදෙස්:-**
- ✓ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- ✓ **1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (i), (ii), (iii), (iv), (v) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන පිළිතුර තෝරාන්න.**

1. ඊශ්වර නිර්මාණවාදී සංකල්පයට අනුව භාරතීය සමාජයේ සංස්ථාවලට වගකීම් පවරා තිබුණි. එම පැවරීම් අතරින් ශමදායකයන් ලෙස කුලීන සමාජයට මෙහෙවර කිරීමේ වගකීම භාර වූයේ,
   (i) වෛශ්‍ය සමාජයට
   (ii) ක්ෂත්‍රිය සමාජයට
   (iii) ශුද්‍ර සමාජයට
   (iv) පංච ම සමාජයට
   (v) ශ්‍රමණ සමාජයට

2. බ්‍රාහ්මණ සමාජය තුළ බ්‍රාහ්මණයා විසින් තම වර්ණයට අමතර ව ක්ෂත්‍රිය, වෛශ්‍ය කුලයන් හි කාර්යයන් ද ඉටු කිරීමට පෙළඹිණි. මෙම කාර්යයන් අතර රාජ්‍ය පාලන තන්ත්‍රයට හිමි වූයේ විශේෂ තැනකි. එම වගකීම භාර වූයේ,
   (i) බ්‍රාහ්මණයන්ට
   (ii) ක්ෂත්‍රියයන්ට
   (iii) වෛශ්‍යයන්ට
   (iv) මහා බ්‍රහ්මයාට
   (v) පුක්කුසයන්ට

3. මහා බ්‍රහ්මයාගේ ශරීරාංගවලින් පුද්ගලයා බිහි වූයේ යැයි පවසන බ්‍රාහ්මණයා පසුකාලීන ව බ්‍රහ්මචාරී, ගෘහස්ත, වානප්‍රස්ථ සන්‍යාසි, නමින් සංකල්පනාවන් ද ක්‍රියාත්මක කර ඇත. මෙම සංකල්පනාවෙන්,
   (i) සමාජ වර්ගීකරණයක් සිදුව ඇත.
   (ii) ආගමික නිදහස සීමා වී ඇත.
   (iii) ගෘහස්ත ජීවිතයට බාධා පමුණුවා ඇත.
   (iv) බ්‍රාහ්මණ බලය තහවුරු කර ඇත.
   (v) ජීවිතය වර්ගීකරණය කර ඇත.

4. බ්‍රාහ්මණ සංස්කෘතිය බුද්ධ කාලීන කාන්තාවගේ සමාජීය, ආර්ථික, දේශපාලනික, ආගමික සාහිත්‍යයෙන් ද බෞද්ධ මූලාශ්‍රයන්ගෙන් ද පැහැදිලි වේ. එහෙත් ආධ්‍යාත්මික විමුක්තිය සඳහා ස්ත්‍රීත්වය බාධාවක් නොවන බව බුදු සමය මගින් අවධාරණය කරයි. එය තහවුරු වන්නේ,
   (i) ථෙරී ගාථාවල දැක්වෙන භික්ෂුණීන්ගේ ප්‍රකාශ මගිනි.
   (ii) මවක වශයෙන් වන්දනීය තත්ත්වයක් කාන්තාවට හිමිකර දීමෙනි.
   (iii) බිරිඳක් වශයෙන් කාන්තාවගේ අයිතිවාසිකම් තහවුරු කර තිබීමෙනි.
   (iv) බිරිඳ ස්වාමියාගේ හොඳ ම මිතුරිය ලෙස හඳුන්වා දීමෙනි.
   (v) කාන්තාවන් ඒ ඒ තන්හි දී විචක්ෂණශීලිව ක්‍රියා කරන බව දේශනා කිරීමෙනි.

5. බ්‍රාහ්මණ සමාජයේ පීඩාවට පත් පිරිසක් වූ කාන්තාවන් වැන්දඹු බවට පත් වූ විට ජීවිතය පවත්වා ගැනීම සඳහා දක්වා ඇති ප්‍රතිපදාවක් වන්නේ,
   (i) සති පූජාව යි.
   (ii) විධවා ව්‍රතය යි.
   (iii) හුදකලා වාසය යි.
   (iv) තාපස චර්යාව යි.
   (v) බැල මෙහෙවර කිරීම යි.

Artsapi.lk

6. කාන්තා විමුක්තිය උදෙසා සුවිශේෂ නායකත්වයක් ලබා දුන් බුදු රජාණන් වහන්සේ සමාජය තුළ දී කාන්තාවට සමානාත්මතාවයක් ද හිමිකර දුන්හ. තනතුරු පිරිනැමීම ඒ සඳහා නිදසුනකි. තනතුරු ලබා දීමේ දී ධම්මකථිකාවියන් අතර අග්‍රස්ථානය ලැබූ භික්ෂුණිය වූයේ,
(i) මහා ප්‍රජාපතීගෝතමී තෙරණිය යි.
(ii) ධම්මදින්නා තෙරණිය යි.
(iii) පටාචාරා තෙරණිය යි.
(iv) ඛේමා තෙරණිය යි.
(v) උප්පලවණ්ණා තෙරණිය යි.

7. පරලොවක් ඇද් දැ යි ප්‍රශ්න කළහොත් ඇත කියා හෝ නැත කියා හෝ හෙතෙම නොකිය යි. ඇත එමෙන් ම නැත කියා හෝ ඇත්තේ ත් නැත නැත්තේ ත් නැත කියා හෝ නොකිය යි. මෙම අවිනිශ්චිතවාදී සංකල්පය ඉදිරිපත් කරන ලද්දේ,
(i) නිගණ්ඨනාථ පුත්ත ශාස්තෘතුමා ය.
(ii) අජිත කේසකම්බලි ශාස්තෘතුමා ය.
(iii) සංජයබෙල්ලට්ඨිපුත්ත ශාස්තෘතුමා ය.
(iv) පූර්ණකස්සප ශාස්තෘතුමා ය.
(v) පකුධ කච්චායන ශාස්තෘතුමා ය.

8. භාරතීය ආර්ථිකයේ ප්‍රවණතාවයට වාණිජකරණය බෙහෙවින් ම බලපෑවේ ය. වාණිජකරණ ප්‍රවණතාවය උදෙසා සිටුවරුන්ගේ දායකත්වය නොමඳ ව ලැබුණි. එම සිටුවරුන්ගෙන් ලැබුණු සහයෝගයට අමතර ව වෙළෙඳාමේ උන්නතියට වඩාත් ම වැදගත් අයුරින් දායක වූයේ,
(i) සම්බාහන මධ්‍යස්ථාන ඇති වීමයි.
(ii) ගණික වෘත්තිය සමාජගත වීමයි.
(iii) සමාජශාලා ඇති වීමයි.
(iv) ආපනශාලා ඇති වීමයි.
(v) සුප්පාරක තාම්බුලිප්ති වැනි තොටුපොලවල් ඇති වීමයි.

9. ජනසම්මතවාදී සාම්ප්‍රදායික ලක්ෂණ රැක ගැනීමට වුවමනා කරන ආචාර ධර්ම පද්ධතියක් අනුගමනය කළ බුද්ධ කාලීන භාරතීය ආදර්ශවත් පාලක පිරිසක් වනුයේ,
(i) ශාක්‍ය වංශිකයන් ය.
(ii) මෞර්ය වංශිකයන් ය.
(iii) කෝලිය වංශිකයන් ය.
(iv) ලිච්ඡවි වංශිකයන් ය.
(v) මල්ලව වංශිකයන් ය.

10. බුද්ධකාලීන භාරතයේ සොළොස් මහා ජනපද අතර නිරන්තර යුධ ගැටුම් ඇති විය. එම අරගලයෙහි ජයග්‍රාහී බලවතුන් වූයේ,
(i) වත්ස - අවන්ති රාජ්‍යයන් ය.
(ii) මගධ - කෝසල රාජ්‍යයන් ය.
(iii) වජ්ජි - මගධ රාජ්‍යයන් ය.
(iv) කුරු පංචාල රාජ්‍යයන් ය.
(v) උදේනි - කෝසල රාජ්‍යයන් ය.

11. තමාගේ යහපත හා අයහපත සලසා ගැනීම සඳහා පුද්ගලයාට ඇති ස්වාධීනතාව බුදු දහම පිළිගනී. ඒ අනුව තම යහපත සඳහා පුද්ගලයකු තෝරා ගත යුතු සුදුසු ම මාර්ගය පහදා දෙන සූත්‍රය වන්නේ,
(i) පරාභව සූත්‍රය යි.
(ii) සිඟාලෝවාද සූත්‍රය යි.
(iii) ව්‍යග්ගපජ්ජ සූත්‍රය යි.
(iv) මහා මංගල සූත්‍රය යි.
(v) තමෝ තම පරායන සූත්‍රය යි.

Artsapi.lk

12. මහා බ්‍රහ්මයාගේ මැවුම් වාදයට අනුව සමාජය චතුර් වර්ණයට යටත් කරන ලද බව වෛදික සාහිත්‍යයේ සඳහන් වේ. දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයට අනුව සමාජය පළමුව ප්‍රභවය වූ වර්ණය වන්නේ,

(i) බ්‍රාහ්මණ වර්ණය යි. (iii) වෛශ්‍ය වර්ණය යි. (v) ක්ෂුද්‍ර වර්ණය යි.
(ii) නේසාද වර්ණය යි. (iv) ක්ෂත්‍රිය වර්ණය යි.

13. පාලකයන් විසින් නිර්ධනයන්ට මුදල් නොදීම නිසා දිළිඳු බව ඇති වීම, එම නිසා ම සොරකම, අවි - ආයුධ, ප්‍රාණඝාතය, බොරුව, ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, මුසාවාදය, කාමයෙහි වරදවා හැසිරීම ආදිය ද ඇති විය. මෙම ලාමක ධර්මයන් ඇති වන අයුරු පෙන්වා දෙන සූත්‍රය,

(i) අග්ගඤ්ඤ සූත්‍රය යි. (iv) සිඟාලෝවාද සූත්‍රය යි.
(ii) චක්කවත්ති සීහනාද සූත්‍රය යි. (v) ව්‍යග්ගපජ්ජ සූත්‍රය යි.
(iii) විමංසක සූත්‍රය යි.

14. සිඟාලෝවාද සූත්‍රයේ දැක්වෙන සංස්ථාවන්ට අනුව බටහිර දිශාවේ දී ස්වාමි භාර්යා යුතුකම් හා වගකීම් ගැන කියවේ. එහි දී ස්වාමි පුරුෂයා සිය බිරිඳ සම්මානයට ලක් කළ යුතු ය. ඇයට අවමන් නොකළ යුතු ය. තම බිරිඳ හැර වෙනත් ස්ත්‍රීන් නොපැතිය යුතු ය. නිවසෙහි ආධිපත්‍ය ඇයට පැවරිය යුතු ය. බිරිඳ කැමති ම වස්ත්‍රාභරණ හැකියාකාරයෙන් සැපයිය යුතු ය. මෙම යුතුකම් ඉටු කිරීම මගින් ප්‍රකට වන්නේ,

(i) පවුල තුළ කාන්තාවට ගෞරවනීය තත්ත්වයක් හිමි කර දී ඇති බව යි.
(ii) පවුල තුළ බිරිය ස්වාමියාට වඩා උතුම් බව යි.
(iii) මවක් වශයෙන් කාන්තාව පූජනීය තත්ත්වයට පත්කර ඇති බව යි.
(iv) බිරිඳත් ස්වාමියාත් සමාන තත්ත්වයෙන් ම සැලකිය යුතු බව යි.
(v) පුරුෂයාට මෙන් ම කාන්තාවට විමුක්තිය සඳහා සමාන හැකියාවක් ඇති බව යි.

15. කුසලාකුසල ක්‍රියා විනිශ්චය කිරීමේ දී තමා තමාට හඳුනා ගත හැකි නිර්ණායක බුදු දහමේ පෙන්වා දී ඇත. ඒ අනුව කුසලාකුසල කර්ම විනිශ්චය කළ හැකි එක් නිවැරදි නිර්ණායකයක් වන්නේ,

(i) ග්‍රන්ථ පරිශීලනය කොට ඉන් ලබා ගන්නා දැනුම භාවිතයට ගැනීම යි.
(ii) පරපුරෙහි පිළිගත් නිසා පිළිගැනීම යි.
(iii) ගුරු උපදෙස්වලට අනුගත වීම යි.
(iv) අත්තාහිත බව හා පරහිත බව පරීක්ෂාකොට බැලීම යි.
(v) ධර්මය උගත් පණ්ඩිතයෙකුගෙන් විමසා දැන ගැනීම යි.

16. කුසල හා අකුසල මූලධර්ම පිළිබඳ ව කාලාම සූත්‍රයේ ඉගැන්වීම පුද්ගල හා සමාජීය ලෙස අතිශයින් වැදගත් වේ. එසේ වන්නේ,

(i) සමාජය හා ආර්ථිකය තුලනාත්මක ව විග්‍රහ කළ හැකි බැවිනි.
(ii) විසංවාදී අදහස් සමග ගැනීමේ දී තර්කානුකූල ව තීරණ ගැනීමේ හැකියාව උදාවන බැවිනි.
(iii) වාද විවාදවල දී තම මතය නිසැකවම ජයග්‍රහණය කරවිය හැකි බැවිනි.
(iv) යම් තීරණයකට එළඹීමට පෙර සම්ප්‍රදායන්ට මුල්තැන දීමේ හැකියාව උපදවන බැවිනි.
(v) ක්‍රියාවන්හි ප්‍රතිඵල තමාට හා අනුන්ට බලපාන අයුරු නුවණින් දැකිය හැකි බැවිනි.

Artsapi.lk

17. ගිහියන්ගේ භෞතික දියුණුව පිළිබඳ උපදෙස් බුදු දහමේ දැක්වේ. ඒ අනුව ධනය පිළිබඳව නිවැරදි බෞද්ධ මතය ප්‍රකාශ වන්නේ,

(i) උත්සාහවන්තව ධනය උපයා අවමයෙන් වැය කළ යුතු ය යන්න යි.
(ii) ආයෝජනයට මුල්තැන දෙමින් පරිභෝජනයට දෙවන තැන දිය යුතු ය යන්න යි.
(iii) වැය ප්‍රමාණයට සරිලන සේ ධනය ඉපැයිය යුතු ය යන්න යි.
(iv) ආර්ය ධර්මයෙහි පිහිටා නිවැරදි කර්මාන්තයෙන් ධනය ඉපැයිය යුතු ය යන්න යි.
(v) කෘෂිකාර්මික ජීවනෝපායකින් ධනය ඉපැයිය යුතු ය යන්න යි.

18. සෞන්දර්ය රසාස්වාදය පිළිබඳ නිවැරදි බෞද්ධ මතය වන්නේ,

(i) ජීවිකාව සඳහා ගායනා කිරීම වරදක් නොවේ.
(ii) සුන්දරත්වයේ විතරාගී සුවය ගිහියාට විඳිය හැකි ය.
(iii) ආර්ය ජාතියෙහි ගීතය විලාපයක් කොට තිබේ.
(iv) පංචේන්ද්‍රිය සුඛාස්වාදයට යොමු කිරීම අකුසලයකි.
(v) සෞන්දර්ය රසාස්වාදය බුදු දහමින් සපුරා බැහැර කොට ඇත.

19. පර දුක්ඛෙ සති සාධුනං හදය කම්පනං කරෝතීති යන ප්‍රකාශය තුළ බුදු රජාණන් වහන්සේගේ විශේෂ ගුණයක් පිළිබඳ ව කියවේ. එම ගුණාංගය වෙනුයේ,

(i) උතුම් මහා කරුණා ගුණය වේ.
(ii) උතුම් තාදී ගුණය වේ.
(iii) උතුම් මහා ප්‍රඥා ගුණය වේ.
(iv) උතුම් පද්මාකාර ගුණය වේ.
(v) උතුම් පුරිස ධම්ම සාරථී ගුණය වේ.

20. කුඩා සාමණේර භික්ෂුවක් උපසම්පදාවට පත් කිරීම සඳහා නියමිත වයස් සීමාව ලෙස විනය පිටකයෙහි සඳහන් වන්නේ,

(i) වයස අවුරුදු 15 දී ය.
(ii) වයස අවුරුදු 20 දී ය.
(iii) වයස අවුරුදු 40 දී ය.
(iv) වයස අවුරුදු 25 දී ය.
(v) වයස අවුරුදු 30 දී ය.

21. ගිහියා ධාර්මිකව උපයා ගනු ලබන්නා වූ වස්තුව වියදම් කරමින් භික්ෂුව පූජාවට ලක් කළ හැකිය. මේ උතුම් ගුණය දහමේ සඳහන් වන්නේ,

(i) ආහුණෙය්‍ය ගුණය
(ii) සුපටිපන්න ගුණය
(iii) අන්ජලිකරණීය ගුණය
(iv) දක්ඛිණෙය්‍ය ගුණය
(v) පාහුණෙය්‍ය ගුණය

22. මුල් වකවානුවේ පැවිදි සමාජයට පත් සියලු ම භික්ෂූන් පැවිදි උපසම්පදා කිරීම සඳහා උපයෝගී කොට ගත් පැවිදි උපසම්පදා ක්‍රමය ලෙස හඳුන්වන්නේ,

(i) අට්ඨ වාචික ක්‍රමය යි.
(ii) ඒහි භික්ඛු ක්‍රමය යි.
(iii) ධූතේන ක්‍රමය යි.
(iv) ඤත්ති චතුත්තක ක්‍රමය යි.
(v) සරණාගමන ක්‍රමය යි.

23. කඨිනය ඇතිරූ භික්ෂුවට එයින් පසුව ලැබෙන වරප්‍රසාද ලෙස නොසැලකෙන්නේ,

(i) නොවිමසා නොවිචාරා ගම් වැදීම යි.
(ii) ඝන ආහාර අනුභව කිරීම යි.
(iii) කැමති තරම් සිවුරු පිරිකර ලැබීම යි.
(iv) උපැවිදි වීමට ඇති වරප්‍රසාදය යි.
(v) වැඩ වසන වෙහෙරේ කැමති තරම් සිවුරු පිරිකර රැස් කිරීම යි.

Artsapi.lk

24. ප්‍රථම ධර්ම සංගායනාවෙන් ඉටුකරගත් ප්‍රධාන අවශ්‍යතාවයක් වූයේ,
(i) ශාසනය දුසිල්වතුන්ගෙන් ආරක්ෂා කර ගැනීම යි.
(ii) බුද්ධ දේශනා එක් රැස්කර සුරක්ෂිත කර ගැනීම යි.
(iii) තීර්ථතකයන්ගෙන් ශාසනය ආරක්ෂා කර ගැනීම යි.
(iv) අජාසත් රජුගේ රැකවරණය ශාසනයට ලබා ගැනීම යි.
(v) ජෛන ශාසනයෙහි පූර්වාදර්ශය අනුකරණය කිරීම යි.

25. ධර්ම සංගීති යන්න බුදුන් වහන්සේ ඉදිරිපත් කළ සංකල්පයකි. උන් වහන්සේ භික්ෂූන්ගේ අපේක්ෂා කළේ,
(i) ධර්මය පිළිබඳව අන්‍යෝන්‍යව විවාද කිරීම යි.
(ii) ධර්මය පිළිබඳ අන් මතධාරීන් හා විවාද කිරීම යි.
(iii) ධර්මය පිළිබඳ විවාද සඳහා දැනුම වඩවා ගැනීම යි.
(iv) ධර්මය පිළිබඳ විවාද නොකොට සාකච්ඡා කිරීම යි.
(v) ධර්මය පිළිබඳ ග්‍රන්ථ වෙන් කිරීම යි.

26. තෙවන ධර්ම සංගායනාව පවත්වන කාලවකවානුව වන විට ධර්මය සංරක්ෂණය කිරීම පිළිබඳ මහතෙරවරුන්ගේ කාර්ය භාරයෙහි සම්පූර්ණ කිරීමට ඉතිරිව පැවතියේ,
(i) විනය පිටකය ය.
(ii) සූත්‍ර පිටකය ය.
(iii) ඛුද්ධක නිකාය ය.
(iv) අටුවා රචනාවන් ය.
(v) අභිධර්ම පිටකය ය.

27. ආගමික ග්‍රන්ථයක් මතම විශ්වාසය තබා තීරණ ගැනීමට පෙළඹීම ප්‍රඥා ගෝචර නොවන බව ප්‍රකාශ වන ඉගැන්වීම වන්නේ,
(i) මා පරම්පරාය
(ii) මා ඉතිරිකරාය
(iii) මා අනුස්සවේන
(iv) මා ආකාර පරිවිතක්කේන
(v) මා පිටක සම්පදානේන

28. තමා කළ වැරදි ගැන පසුතැවිලි වන තැනැත්තෙකු එම වැරදි නැවත නැවත නොවීම සඳහා සිතුවිලි උපදවා ගැනීමට සුදුසු උපදේශය ලබා දෙන ධර්මය වන්නේ,
(i) ලෝකාධිපතෙය්‍ය ධර්මය යි.
(ii) ධම්මාධිපතෙය්‍ය ධර්මය යි.
(iii) අත්තාධිපතෙය්‍ය ධර්මය යි.
(iv) අත්තූපනායික ධර්මය යි.
(v) චතුෂ්කෝටික ධර්මය යි.

29. අශෝක ධර්මය පිළිබඳ පිළිගත හැකි උසස් ම ප්‍රකාශය වන්නේ,
(i) බුදු දහමේ හා අන් ආගම්වල ආභාෂයෙන් සකසන ලදී.
(ii) ධර්ම මාහාමාත්‍යවරු විසින් සකස් කරන ලදී.
(iii) බින්දු සාර රජුගේ උපදෙස් අනුව සකස් කරන ලදී.
(iv) අන්‍යාගමික අදහස් අනුව සකස් කරන ලදී.
(v) සම්පූර්ණයෙන් ම බුදු දහමේ ආභාෂයෙන් සකසන ලදී.

30. නිර්මල බුද්ධ වචනය ආරක්ෂා කිරීමට මහ රහතන් වහන්සේලා මෙන් ම බෞද්ධ රජ දරුවන් ද ඇප කැප වී ක්‍රියා කර තිබේ. කණිෂ්ක රජතුමා ද තම රාජ්‍ය කාලය තුළ මහායාන ධර්ම සංගායනාවක් සිදු කළ අතර, එහි ප්‍රධානත්වය ගෙන කටයුතු කළේ,
(i) මහා කාශ්‍යප තෙරණුවෝ ය.
(ii) සබ්බකාමී තෙරණුවෝ ය.
(iii) යස තෙරණුවෝ ය.
(iv) පාර්ශ්ව තෙරණුවෝ ය.
(v) මොග්ගලී පුත්ත තිස්ස තෙරණුවෝ ය.

Artsapi.lk

31. චීනයෙන් ජපානයට පැමිණි චාන් සම්ප්‍රදාය ජපානයේ දී සෙන් නමින් හැඳින්විය. එය ජපානය තුළ සීඝ්‍ර ව්‍යාප්තියකට ලක් වූ බව දක්නට ලැබේ. සෙන් නිකායේ ඉගැන්වීම වන්නේ ධ්‍යාන භාවනාවයි. එම භාවනාව වැඩීමෙන් ක්ෂණික ව හෝ ක්‍රමික ව බුද්ධත්වයට පත්විය හැකි බව ජපන් සෙන් ආගමිකයන්ගේ මතය වේ.

(i) පසේ බුද්ධත්වයට පත්වීමයි.
(ii) අමිතාභ බුද්ධත්වයට පත්වීමයි.
(iii) සතෝරි බුද්ධත්වයට පත්වීමයි.
(iv) රහත් තත්ත්වයට පත්වීමයි.
(v) අනාගාමීත්වයට පත්වීමයි.

32. හයිකු යනු,

(i) නාට්‍ය කලාව කි.
(ii) අලුත් අවුරුදු උත්සවය කි.
(iii) කාව්‍ය සම්ප්‍රදාය කි.
(iv) තේ පානෝත්සවය කි.
(v) මළවුන්ගේ උත්සවය කි.

33. තෙවන සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස විවිධ රටවලට බුදු දහම හඳුන්වා දීමට අශෝක රජුට හැකියාව ලැබුණි. එසේ හඳුන්වා දුන් රටවල් අතරින් ස්වර්ණභූමියට බුදු දහම රැගෙන වැඩම කළේ,

(i) මොග්ගලී පුත්ත තිස්ස හිමියන් ය.
(ii) මහා කාශ්‍යප හිමියන් ය.
(iii) උපාලි හිමියන් ය.
(iv) ආනන්ද හිමියන් ය.
(v) සෝණ, උත්තර හිමිවරුන් ය.

34. ශ්‍රී ලංකාව, බුරුමය හා සියමය යන රටවල් නිර්මල ථේරවාදී බෞද්ධ දර්ශනය ක්‍රියාත්මක කළ රටවල් තුනකි. ඒවා අතරින් බුරුමය හා සියමය ලංකාව සමග ඉතා කිට්ටු ආගමික සම්බන්ධතා පවත්වාගෙන ගිය බව ඓතිහාසික සාධක මගින් දක්නට ලැබේ. මේ අනුව විවිධ අවස්ථාවන්වල දී ලංකාවේ පැවිද්ද නැත වූ විට මෙම රටවලින් එය ගෙන්වා ගෙන ඇත. උපසම්පදාව ත් එලෙසින් ම ගෙන්වා ගෙන තිබේ. සියම් රාජ්‍යයෙන් සියම් නිකාය ගෙන්වා ගැනීමට කටයුතු කරනු ලැබූයේ,

(i) වැලිවිට සරණංකර හිමියෝ ය.
(ii) බෝධි ධර්ම හිමියෝ ය.
(iii) වැලිවිට ශ්‍රී විමල හිමියෝ ය.
(iv) ආනන්ද මෛත්‍රී හිමියෝ ය.
(v) බෝධිරාම හිමියෝ ය.

35. චීනය තුළ භික්ෂු ශාසනය මෙන් ම භික්ෂුණී ශාසනය ද පිහිටු විය. එහි භික්ෂුණී ශාසනය දෙවන වර පිහිටුවීමේ දී ප්‍රමුඛ ව ක්‍රියා කරන ලද ලාංකික භික්ෂුණිය වනුයේ,

(i) අනුලා භික්ෂුණිය වේ.
(ii) දේවසරා භික්ෂුණිය වේ.
(iii) පටාචාරා භික්ෂුණිය වේ.
(iv) සකුලා භික්ෂුණිය වේ.
(v) නන්දා භික්ෂුණිය වේ.

36. බුද්ධ ප්‍රතිමාවේ ආරම්භය බුද්ධ කාලයේ දී ම සිදු වූ බවට සාහිත්‍යමය සාධක පවතින අතර, ඒ පිළිබඳ උගතුන් ද විවිධ මත පළ කර තිබේ. මේ අතර ගන්ධාර හා මථුරා බුදු පිළිම පිළිබඳ වඩාත් ගැඹුරින් අදහස් ඉදිරිපත් කර, සුවිශේෂී ලක්ෂණ ද පෙන්වා දී ඇත. එම සුවිශේෂී ලක්ෂණ අතර ගන්ධාරයට පමණක් විශේෂ වූ ලක්ෂණයක් වූයේ,

(i) හිස කෙස් කැරලි ගැසී තිබීම යි.
(ii) මහා කරුණා ලීලාව දැක්වීම යි.
(iii) ධර්ම චක්‍ර මුද්‍රාව ඇතුළත් ව තිබීම යි.
(iv) භූමිස්පර්ශ මුද්‍රාවෙන් සමන්විත වීම යි.
(v) පද්මාසනයේ වැඩ සිටීම යි.

Artsapi.lk

37. සඳකඩපහණේ නිරූපිත කැටයම් තුළින් විවිධ සංකේතාර්ථ ධ්වනිත වන බව විද්වත් මතය යි. ඒ අනුව සඳකඩපහණේ පිටතින් ම දැක්වෙන කැටයම ගිනි දැල්ලකි. එයින් ගම්‍ය වන්නේ ලෝකය තණ්හාව හා වෛරය නිසා නිරන්තරව ම ඇවිළෙන දැල්වෙන බව යි. ඒ අනුව ලියවැල්වලින් නිරූපණය වන්නේ,
(i) කැටයම් කලාවේ කුසලතාව යි.
(ii) තෘෂ්ණාවෙන් සසර බැඳී සිටින බව යි.
(iii) භවචක්‍රය පිළිබඳව යි.
(iv) අනුරාධපුර යුගයේ සුවිශේෂත්වය යි.
(v) පාරිශුද්ධ බව යි.

38. බුදු පිළිම වහන්සේ සඳහා සකස් කළ කුටි පධීමා ඝර හෙවත් පිළිම ගෙවල් නමින් හඳුන්වයි. බුදු පිළිමයට ලැබිය යුතු ගෞරවය නිසා ආවරණ සහිත ව මෙම පිළිම ගෙවල් ඉදි කර ඇති අතර, ශ්‍රී ලංකාවේ පැරණි ඉතාමත් චාම් ප්‍රතිමා ඝරයකට නිදසුනකි.
(i) මැදිරිගිරියේ පිළිම ගෙය.
(ii) මහසෙන් මාලිගය අසල ගොඩනැගිල්ල
(iii) ථූපාරාමය අසල ඇති පිළිම ගෙය
(iv) කෙසිකිළි ගලෙක දැක්වෙන ගොඩනැගිල්ල
(v) අනුරාධපුරයේ කිරිබත් වෙහෙර පිළිම ගෙය

39. මහින්දාගමනයට පෙර ලක්දිව දෙවියන් ඇදහීම ප්‍රචලිත ව පැවත ඇත. යක්ෂ, නාග, ගෝත්‍රික ඇදහීම ද එලෙස ම පැවතිණි. යකුන්ගේ අධිපතීත්වය හිමි වූ දෙවියා ලෙස සැලකෙන්නේ,
(i) විරූඪ දෙවියන් ය.
(ii) විරූපාක්ෂ දෙවියන් ය.
(iii) වෛශ්‍රවණ දෙවියන් ය.
(iv) ධෘතරාෂ්ට්‍ර දෙවියන් ය.
(v) විශ්ණු දෙවියන් ය.

40. අතීතයේ සිට ම ශ්‍රී ලාංකිකයෝ සත්ත්ව ඝාතනය පිළිකුල් කළහ. අවිහිංසාව අගය කළහ. සත්ත්ව ඝාතන පාලකයන් විසින් ද තහනම් කර තිබූ අතර මාඝාත ආඥාව ද නීතිගත විය. එම මාඝාත ආඥාව පැන වූ රජතුමා,
(i) දේවානම් පියතිස්ස රජතුමා ය.
(ii) වලගම්බා රජතුමා ය.
(iii) ආමණ්ඩ ගාමිණී අගය රජතුමා ය.
(iv) මුටසීව රජතුමා ය.
(v) දුටුගැමුණු රජතුමා ය.

41. මහා විහාරය අභයගිරිය බුදු සසුනේ ව්‍යාප්තිය වෙනුවෙන් මහඟු මෙහෙවරක් කළ ආයතනයි. අධ්‍යාපන මෙන් ම අධ්‍යාත්මික සංවර්ධනය සිදු කළ මෙම ආයතන තුළ බුද්ධ ප්‍රතිමා තැන්පත් කර තිබුණි. මහාකාල සිලා ප්‍රතිමාව මුලින් ම තැන්පත් කර තිබුණේ,
(i) මහා විහාරයේ ය.
(ii) ජේතවන විහාරයේ ය.
(iii) අභයගිරියේ ය.
(iv) නාග විහාරයේ ය.
(v) කුටිම්බිය විහාරයේ ය.

42. කිසියම් හේතුවක් නොමැති ව බුදු රජාණන් වහන්සේ විනය නීතියක් නොපැන වූ අතර කාලානුරූප ව හෝ අවස්ථානුරූපීව හෝ විනය නීති පැනවීම සිදු කළහ. එහෙත් ධර්මානුකූල නොවන විනය නීති නොපැන වී ය. සසුනේ චිර පැවැත්ම සඳහා පළමුවෙන් ම විනය නීතියක් පනවන ලද්දේ,
(i) සුදින්න හිමියන් මුල් කරගෙන ය.
(ii) ඡන්න හිමියන් මුල් කරගෙන ය.
(iii) සුනක්ඛත්ත හිමියන් මුල් කරගෙන ය.
(iv) දේවදත්ත හිමියන් මුල් කරගෙන ය.
(v) ඡබ්බග්ගිය හිමියන් මුල් කරගෙන ය.

Artsapi.lk

43. පූර්ණ භික්ෂුත්වයට පත්වීම යනු උපසම්පදා වීම යි. මහළු පැවිද්ද යනුවෙන් දැක්වෙන්නේ ද එය යි. සාමණේර භික්ෂුන් උපසම්පදා ලාභීත්වයට පත්විය යුතු ය. එලෙස උපසම්පදා වන භික්ෂුව හඳුන්වන්නේ,
(i) ආවුසො නමිනි
(ii) තිස්ස නමිනි
(iii) නාග නමිනි
(iv) කම්මචාරි නමිනි
(v) ස්ථවිර නමිනි

44. මොග්ගලීපුත්ත තිස්ස හිමිගේ හා අශෝක රජුගේ මූලිකත්වයෙන් නව රට ධර්ම ප්‍රචාරය කිරීමක් සිදු විය. ඒ සඳහා ධර්මදූත කණ්ඩායම් ද නවයක් යොදා ගැනිණි. අපරන්ත දේශයට වැඩම කරන ලද පිරිසෙහි නායකත්වය හිමි වූයේ,
(i) මජ්ඣන්තික තෙරුන්ට ය.
(ii) යෝනක ධම්මරක්ඛිත තෙරුන්ට ය.
(iii) රක්ඛිත තෙරුන්ට ය.
(iv) මහාදේව තෙරුන්ට ය.
(v) මහා ධම්මරක්ඛිත තෙරුන්ට ය.

45. කතමා ච ගහපති ශ්‍රද්ධා සම්පදා ඉධ ගහපති අරිය ශ්‍රාවකයෝ සද්ධෝ . . ශ්‍රද්ධාව නම් තථාගතයන් වහන්සේගේ සම්මා සම්බුද්ධත්වය අවබෝධයෙන් යුතු ව පිළිගැනීම ය. බුදු රජාණන් වහන්සේ නව අරහාදී බුදු ගුණයෙන් යුක්ත බව පිළිගැනීම යි. මෙසේ පිළිගන්නා ශ්‍රද්ධාව,
(i) ආකාරවතී ශ්‍රද්ධාව යි.
(ii) භක්තිමත් ශ්‍රද්ධාව යි.
(iii) අමූලික ශ්‍රද්ධාව යි.
(iv) ධම්මානු සාරී ශ්‍රද්ධාව යි.
(v) ශ්‍රද්ධා අනුසාරී ශ්‍රද්ධාව යි.

46. අණන සූත්‍රයේ ඉගැන්වීමට අනුව අණන සුඛය යනු කුමක් දැයි පැහැදිලි කිරීමට වඩාත් යෝග්‍ය ප්‍රකාශය වන්නේ,
(i) උපයාගත් භෝග සම්පත් ඇතැ යි කියා ලබන සතුට යි.
(ii) ණය ඇති ව භෝග සම්පත් උපයා ගැනීමෙන් ලබන සතුට යි.
(iii) උපයාගත් ධනය මැනවින් පරිභෝග කිරීමෙන් ලබන සතුට යි.
(iv) දැහැමෙන් සෙමින් උපයාගත් භෝග ඇතැයි ලබන සතුට යි.
(v) ණය නැති ව උපයාගත් භෝග සම්පත් ඇතැ යි ලබන සතුට යි.

47. පුද්ගලයාගේ ශ්‍රමය කැප කර හෝ වෙනත් ආකාරයකින් හෝ ලබා ගන්නා ආදායම පරිහරණය කළ යුතු ආකාරය බුදු දහමින් දක්වා ඇති අතර, මෙම ධනය අහේතුක ව විනාශ වී යන අයුරු දැක්වෙන කරුණු හයක් සිඟාලෝවාද සූත්‍රයේ දක්වා තිබේ. එම කරුණු අතරට අයත් නොවන කරුණකි.
(i) මත්පැන් පානය
(ii) අනලස් බව
(iii) පාප මිත්‍ර සේවනය
(iv) දූ කෙළිය
(v) නොකල්හි වීථි සංචාරය

48. ඉපයීමේ දි හා පාරිභෝජනය කිරීමේ දී ධනය කොටස් හතරකට බෙදා කළමනාකරණය කරගත යුතු අයුරු පෙන්වා දෙන සූත්‍රය,
(i) ව්‍යග්ගපජ්ජ සූත්‍රය වේ.
(ii) ධම්මික සූත්‍රය වේ.
(iii) සිඟාලෝවාද සූත්‍රය වේ.
(iv) වණිජ්ජා සූත්‍රය වේ.
(v) පත්තකම්ම සූත්‍රය වේ.

Artsapi.lk

49. කම්මාරමතා, නින්ද්‍රාරාමතා, නව කම්මවිචාරණතා ආදී ලෙස දැක්වෙන්නේ,
(i) ග්‍රාමවාසී භික්ෂූන් සඳහා සුදුසු කටයුතු ය.
(ii) නායක භික්ෂු තනතුරු සඳහා පැවරූ වගකීම් ය.
(iii) වනවාසී භික්ෂූන් සඳහා සුදුසු කටයුතු ය.
(iv) භික්ෂුවගේ අල්ප කෘත්‍ය ජීවිතයට බාධාකාරී කටයුතු ය.
(v) ඕනෑම භික්ෂුවක් විසින් කළ හැකි කටයුතු ය.

50. තමා වැඩ වසන සුන්දර පරිසරය තුළ තමා ද සුරැකී පරිසරය ද සුරැකි ව තබා ගැනීමට බුදු රජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට දුන් උපදේශයක් වන්නේ,
(i) නිතර ආරාම භූමිය අලංකාර කිරීමේ යෙදිය යුතු ය යන්න යි.
(ii) නිල් තණ මත කෙළ, මුත්‍රා ආදිය බැහැර නොකළ යුතු ය යන්න යි.
(iii) දායකයන්ගේ උපකාරයෙන් පරිසරය අලංකාර කළ යුතු ය යන්න යි.
(iv) පරිසර සංරක්ෂණ පිළිබඳ නිතර දේශන පැවැත්විය යුතු ය යන්න යි.
(v) ආරාමය තුළ ස්වභාවික පරිසර ලක්ෂණ නිරූපණය කළ යුතු ය යන්න යි.

Artsapi.lk